# මුදල් මණ්ඩලය
# ශ්‍රී ලංකා මහ බැංකුව

**2016 ඔක්තෝබර් 27 ක්ෂුද්‍රමූල්‍ය පනතේ විධාන 2016 අංක 05**

## කොටස් හිමියන් ඇගයීම

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 11 වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

1. නිර්ණායක

1.1. පුද්ගලයෙකු පහත කරුණු වලට යටත් වන්නේ නම් ඔහුට බලයලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක විශේෂිත කොටස් හිමිකරුවකු විය නොහැක.

අ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පොලිසියක්, යම් නියාමන හෝ අධීක්ෂණ අධිකාරයක්, වෘත්තියවේදීන්ගේ සංගමයක්, විමර්ශන කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක්, හෝ වෙනත් නීතිමය ආයතනයක් මගින් යම් වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් පිළිබඳව සිදු කරනු ලබන විමර්ශනයකට හෝ විභාග කිරීමකට භාජනය වී තිබීම.

ආ) වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් හෝ ඕනෑම නීතියක් හෝ ඒ යටතේ නිකුත් කරන ලද්දා වූ, රීති, රෙගුලාසි, විධාන හෝ නිර්ණයන්ට අනුකූල නොවීම වැනි ක්‍රියාවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නීති මඟින් පිහිටුවන ලද අධිකරණයකින්, නියාමන හෝ අධීක්ෂණ අධිකාරයකින්, වෘත්තියවේදීන්ගේ සංගමයකින්, විමර්ශන කොමිෂන් සභාවකින්, විනිශ්චය සභාවකින් හෝ වෙනත් මණ්ඩලයකින් වැරදිකරුවෙකු හෝ එකී ක්‍රියාවට සම්බන්ධ පාර්ශවයක් ලෙස හඳුනාගෙන වැරදිකරුවකු වී තිබීම.

ඇ) වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වන වරදකට අධිකරණයකින් වැරදිකරු වී හෝ එවැනි වරදක් සම්බන්ධයෙන් අධිකරණයකින් චෝදනා ලබා තිබීම.

ඈ) කිසියම් අධිකරණයකින් සදාචාර විරෝධී ක්‍රියාවකට සම්බන්ධ වරදකට වැරදිකරු වීම.

ඉ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක කිසියම් අධිකරණයකින් වස්තු භංගත්වයට හෝ බංකොලොත් භාවයට පත් බවට ප්‍රකාශ කර තිබීම.

| | | | |
|---|---|---|---|
| 2. | දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම | 2.1. | සෑම බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්ම ඇමුණුම 1හි දැක්වෙන දිවුරුම් ප්‍රකාශය විශේෂිත කොටස් හිමියන්ගෙන් ලබා ගත යුතු අතර එය ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. |
| 3. | අර්ථනිරූපනය | 3.1. | "විශේෂිත කොටස් හිමිකරුවා" යනු ක්ෂුද්‍රමූල්‍ය සමාගමක පළමු කොටස් හිමිකරුවන් දස දෙනා අතර සිටින සහ සමාගමේ කොටස් වලින් සියයට 10 ක (10%) කොටස් වල හිමිකාරිත්වය දරන පුද්ගලයායි. |

ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
මුදල් මණ්ඩලයේ සභාපති
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

ඇමුණුම I

කොටස් හිමියන් විසින් ඉදිරිපත් කල යුතු දිවුරුම් ප්‍රකාශයේ ආකෘතිය

## දිවුරුම් ප්‍රකාශය

.....................................................................................................................................................(ලිපිනය) හි පදිංචි ........................................................................................................ හැඳුනුම්පත් අංක/ගමන් බලපත්‍ර අංක දරන.............................................................................................(සම්පූර්ණ නම) වන මම බෞද්ධ/හින්දු/ක්‍රිස්තියානි/කතෝලික/මුස්ලිම් ආගමිකයකු වශයෙන් ගාම්භීර පූර්වකව ද, අවංකව ද, සත්‍යවාදීව ද මෙසේ සහතික කරමින් ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි[1].

1. ඉහත නම සඳහන් ප්‍රතිඥාකරු/දිවුරුම්කරු මම වෙමි.
2. මම..................................................................................................................(සමාගමේ නම) ආයතනයේ කොටස් හිමියෙකු වේ.
3. මම ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පොලිසියක්, යම් නියාමන හෝ අධීක්ෂණ අධිකාරයක්, වෘත්තියවේදීන්ගේ සංගමයක්, විමර්ශන කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක්, හෝ වෙනත් නීතිමය ආයතනයක් මගින් යම් වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් පිළිබඳව සිදු කරනු ලබන විමර්ශනයකට හෝ විභාග කිරීමකට භාජනය වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.
4. මම වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් හෝ ඕනෑම නීතියක් හෝ ඒ යටතේ නිකුත් කරන ලද්දා වූ, රීති, රෙගුලාසි, විධාන හෝ නිර්ණයන්ට අනුකූල නොවීම වැනි ක්‍රියාවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නීති මඟින් පිහිටුවන ලද අධිකරණයකින්, නියාමන හෝ අධීක්ෂණ අධිකාරයකින්, වෘත්තියවේදීන්ගේ සංගමයකින්, විමර්ශන කොමිෂන් සභාවකින්, විනිශ්චය සභාවකින් හෝ වෙනත් මණ්ඩලයකින් වැරදිකරුවෙකු හෝ එකී ක්‍රියාවට සම්බන්ධ පාර්ශවයක් ලෙස හඳුනාගෙන වැරදිකරුවකු වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.
5. මම වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ ඒ හා සමාන සාපරාධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වන වරදකට අධිකරණයකින් වැරදිකරු වී හෝ එවැනි වරදක් සම්බන්ධයෙන් අධිකරණයකින් චෝදනා ලබා නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.
6. මම කිසියම් අධිකරණයකින් සදාචාර විරෝධී ක්‍රියාවකට සම්බන්ධ වරදකට වැරදිකරු වී නොමැති බවට ප්‍රතිඥා දෙමි/ දිවුරා ප්‍රකාශ කරමි.

මෙම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් කරුණු ප්‍රතිඥාකරුට/දිවුරුම්කරුට කියවා තේරුම්කර දුන් අතර ඔහු/ඇය එම කරුණු සත්‍ය බවට පිළිගෙන ප්‍රතිඥා දී/දිවුරුම් දී.................... දින ....................................... දී මා ඉදිරිපිටදී අත්සන් තබන ලදී.

අදාළ පරිදි මුද්දර අලවන්න.

මා ඉදිරිපිටදී

සාමදාන විනිශ්චයකාර/
දිවුරුම් කොමසාරිස්

සටහන: 1 - අදාල නොවන වචන කපා හරින්න.
- ක්‍රිස්තියානි සහ කතෝලික පුද්ගලයන් දිව්රා ප්‍රකාශ කර සිටිය යුතු අතර බෞද්ධ, හින්දු, මුස්ලිම් සහ වෙනත් ආගම් අදහන පුද්ගලයන් සහතික කරමින් ප්‍රතිඥා දිය යුතුය.